# අනුරාධපුර යුගයේ කාන්තාව සතු දේපළ අයිතිය හා සේවා නියුක්තිය

( බ්‍රහ්මීය ශිලා ල්ඛන ඇසුරෙන්)

ඊ.එම්.එන්. එදිරිනායක[1], පි.ඊ.පි.එස් සඳමාලි[2],ඩබ්.එම්.එස්. සුභාෂණී[3]

[1]පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, රජරටවිශ්වවිද්‍යාලය
nilusha3615@gmail.com
[2]සමාජීයවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
sasithasandamali@gmail.com
[3]සමාජීයවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
sakunthalasuba@gmail.com

ප්‍රමුඛ පද :සේවා නියුක්තිය, පාරම්පරික, දේපළ අයිතිය

## හැඳින්වීම

ක්‍රි. පු 4 සිට ක්‍රි . ව 10 සියවස දක්වා කාලය තුල දේශපාලන , සංස්කෘතික ,ආගමික, ආර්ථික හා සමාජීය යන අංගයන් අනුරාධපුරය කෙන්ද්‍රකොට රාජධානියක් ලෙස වර්ධනය වීමට උපස්ථම්භනය වන ආකාරය හඳුනාගත හැකි ය. මෙලෙස ගොඩනැගෙන අනුරාධපුර රාජධානිය තුළ කාන්තාවගේ සාමාජ භූමිකාවේ අංගයන් කිහිපයක් බ්‍රහ්මී ශිලා ල්ඛන ඇසුරෙන් මෙහිදී අධ්‍යනය කරණු ලබයි. එනම් මෙකල කාන්තාවගේ දේපළ අයිතිය හා සේවා සැපයීම් සිදුවුයේ කේසේද යන්න ප්‍රධාන පර්යේෂණ අරමුණ වූ අතර උප අරමුණු ලෙස මෙම යුගයේ කාන්තාවට හා පුරුෂයා අතර දේපළ අයිතිය හිමිවීම පිළිබඳ සංසාන්දනාත්මකව අධ්‍යනය, දේපළ බෙදී යාම හා සේවා සැපයීමේ දි කාන්තාවගේ දායකත්වය සිදුවුයේ කෙසෙද යන්න හඳුනාගැනිම මෙම අධ්‍යනයේදී සිදුකරනු ලබයි.

## ක්‍රමවේදය

මෙම අධ්‍යනය සිදු කිරිමේ දී ක්ෂෙත්‍ර ගවේශණය මෙන්ම ක්ෂේත්‍ර නොවන ගවේශණය මගින් දත්ත එකරාශි කරගත් අතර,පර්යේෂණයේ සීමාවන් ලෙස ක්‍රි.පු 03 වැනි සියවසේ සිට ක්‍රි.ව 10 වැනි සියවස දක්වා වූ පූර්ව හා අපර ශිලා ලේඛන මෙහි දී අධ්‍යයනය කරනු ලබයි.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

අනුරාධපුර යුගයේ කාන්තාව අභිලේඛන මුලාශ්‍රයවල අභි ( කුමරිය) , ඣිත (දුව දියණිය), බරිය ,ඣත (භාර්යාව) උපාසික (උපාසිකා), ශමණිය (මෙහෙණිය) හා බකිණිය( සොහොයුරිය) යන නම්වලින් හඳුන්වන අතර, මෙකී කාන්තාවන් අතර ද විවිධ කුලවල කාන්තාවන් විය. එනම් උසස් හා පහත් කුලවල කාන්තාවන් වූ අතර " අභි " වැනි විරුදය බොහෝ විට රාජකීය කාන්තාවන් භාවිත කර ඇත.

උදාඃ උපසික- නදිලිය ලෙණෙ (උපාසිකා නදිලිගේ ලෙණ)

(Ic.vo1.1.No124 . ගල් කිරිකන්ද)

දේපළ අයිතිය යනු යමෙකුට හිමි වත්කම යනුවෙන් සරලව දැක්විය හැකි ය. මෙහි දි චංචල හෝ නිශ්චල වශයෙන් ද දේපළ පැවතිය හැක. අනුරාධපුර යුගයේ කාන්තාව සතුව දේපළ අයිතිය කෙලෙස පැවතුනෙදැයි අධ්‍යනය කිරිමේ දි සැළකිය යුතු කරුණු කිහිපයකි .එනම් මෙකළ සමාජයේ පැවති පුරුෂ මුලික සමාජ ක්‍රමය, සාම්ප්‍රදායික පවුල් සංස්ථාව

තුළ කාන්තාව සතු වගකිම් යන ආදිය පිළිබඳ සැලකිළිමත් වෙමින් , මෙහි දී අධ්‍යනය කළ යුතුය. එනම් පූර්ව බ්‍රහ්මී ශිලා ලිපි වලට අනුව කාන්තාව සතුව ස්වාධීන ලෙස දේපළ අයිතියක් පැවත නොමැති, අතර අපර බ්‍රහ්මී ශිලා ලිපිවලට අනුව එම තත්ත්වය වෙනස් වන අයුරු හඳුනාගත හැකි ය.

උදඃගපති වෙග ඣිතය උපශික විශකය ලෙණෙ (වෙග ගෘහපතිගේ දූ වූ විශාඛා උපාසිකාවගේ ලෙණ)(Ic.vol.1.No 05)

උපසික තිසය ලෙණෙ ශගශ (උපාසිකා තිස්සාගේ ලෙණ සංඝයාට)(Ic,vol,1.No 1232)

මිහින්තලය ලිපියේ, දක්වා ඇති ආකාරයට ගෘහ මූලික වූ " වෙග" නම් පුද්ගලයාගේ දියණිය විශාඛා ලෙස කාන්තාව ගේ නම දක්වා ඇත. මෙයින් පැහැදිලි වනුයේ මුල් යුගයේ දී, එනම් ක්‍රි. පූ 4-ක්‍රි.ව 6 වැනි සියවස කාලයේ දී කාන්තාව පුරුෂයාගේ අනන්‍යයතාවයෙන් තම දේපළ හිමිකම දක්වා ඇති බවයි. මෙයට හේතුව අනුරාධපුර සමාජ ක්‍රමය පුරුෂ මූලික බවකින් යුක්ත විමයැයි හෝ කාන්තාව, පුරුෂයා හා සමමට්ටමින් නොසිටි නිසා යැයි උපකල්පනය කළ හැකි ය. නමුත් ක්‍රි. ව 7- 8 සියවස්වල දී එනම් අපර බ්‍රහ්මීය ශිලා ලිපි ලියවෙන යුගයේ දී කාන්තාවට ස්වාධින දේපළ හිමිකමක් පැවති බව හඳුනාගත හැකි ය. එනම් මෙහි ලාබුගල ලිපියේ උපාසික තිස්සා ඍජු ලෙසම තම අනන්‍යතාව ඉදිරිපත් කොට ඇති අතර පුරුෂ නාමයක් මුල්කොට ගෙන ඉදිරිපත් කොට නොමැති විම විශේෂත්වයකි. මෙයට හේතුව අනුලා වැනි බිසෝවරු රාජ්‍ය බලයට පත්විම මත කාන්තාවන් තමන් ගේ අනන්‍යතාව ඍජු ලෙස දක්වන්නට ඇති බව උපකල්පනය කළ හැකි ය. නමුත් ඇතැම් අවස්ථාවල දේපළ හිමිකම සම අයුරින් පැවතුන අවස්ථා ද ක්‍රි.ව 06 හා 07 වැනි සියවස් අතර කාලයට අයත් පූර්ව ශිලා ලිපියක් වන නීලගම පර්වත ලිපිය අනුව හඳුනාගත හැකි ය.

"අභහ ච ඣය රුලය ච ලෙණෙ" (අභයගේ ද ඔහුගේ භාර්යාවගේ ද ලෙණ සංඝයාට)

(නීලගම Ic,vol.1.No 875)

මෙයින් පැහැදිලි වනුයේ මුල් කාලයේ දී පුරුෂ මූලික බව පැවතුනත් ක්‍රමයෙන් එය වෙනස් වන ආකාරයත්ය. එමෙන්ම මෙම ශිලා ලිපි තුළින්ලබාගත හැකි නිගමනයක් වන්නේ මෙම යුගයේ කාන්තාව සතුව පැවත ඇත්තේ බෝහෝමයක් ලෙන් වන අතර වටිනා දේපළ බහුලව පැවත ඇත්තේ රාජකීය කාන්තාවන් අතර බව ද හඳුනාගත හැකි ය. එනම් බුද්ධපාරින් ද රජු ගේ බිසව විහාරයකට රන්, රිදි, සඵම්භ ,පට රෙදි පූජා කළ බව දැක්වේ. එමෙන්ම වසභ රජු ගේ මව ද මුදල් යොදවා විහාරස්ථානවලට මෙවැනි දිමනා ලබා දී ඇති බව මූලාශ්‍රය ගත කරුණු අනුව හඳුනාගත හැකි ය. මෙ මඟින් පැහැදිලි වනුයේ රාජකිය කාන්තාවන් හැරෙන්නට මෙවැනි වටිනා දේ ලබා දීම හා රාජකීය නොවන කාන්තාවන්ට හැකියාවක් නොතිබූ බවත් ය. එමෙන්ම මුල් කාලයේ දී දේපළ හිමිකම ස්වාධින නොවූවද පසුකාලයේ එය යමතාක් දුරට වෙනස් ව පුරුෂයා හා සමමට්ටමින් හිමිව තිබූ බව හඳුනාගත හැකි ය.

අනුරාධපුර යුගයේ කාන්තාවගේ සේවා නියුක්තිය හෙවත් සේවා සැපයිම. එනම් රාජ්‍ය තුල කාන්තාව සැපයූ සේවාවන් පිළිබඳ විමසිමේ දී පැහැදිලිව පෙනෙන්ට තිබෙන කරුණක් නම් පුරුෂයන් හා සමමට්ටමින් නොපැවතිමයි. නමුත් කාන්තාවන් ඇතැම් අවස්ථාවල සේවා සැපයිම පිළිබඳ අසන්නට ලැබේ. එනම් හතරවැනි මිහිඳු රජුගේ මිහින්තලා පුවරු ලිපියෙහි මිහින්තලා විහාරයට සේවය සැපයූ කාන්තාවන් වෙනුවෙන් ලබාදුන් දිමනා පිළිබඳ ව සදහන් වේ. "මීඩි වැජරුම" නමින් හැඳින්වූ සේවිකාව

යටතේ සේවය කළ "මීඩ්" නම් සේවිකාවන් විසිහතර දෙනෙකු පිළිබද හා "ජෙට් මව "හා "වට්මිඩ් "ලෙස වී කොටන කාන්තාවන් හදුන්වා ඇත. මෙහි සේවය කළ දාසියන් හට ඉඩම් ප්‍රදානය කොට ඇති බවද හඳුනාගත හැකි ය. එමෙන් ම සීගිරි කුරුටු ගීයක වෘත්තියක් වශයෙන් රෙදි අපුල්ලන" රජක" කාන්තාවක් ගැන සදහන් වේ .

"පිළි අපුලන තොටි නැත්තෙන් හළුගර් නැත්තෙන

වැද වෙසෙස් රිදියක් බෙයණන්හි රන්වනුන් අතුරේ "(Paranavitana 1956 .410)

තවත් සිගිරි කුරුටු ගී කිහිපයකින් පරිවාර කාන්තාවන් ලෙස හා ගණිකා වෘත්තියේ යෙදි සිටි කාන්තාවන් පිළිබද හදුනාගත හැකි ය. එමෙන්ම අභයගිරි විහාරෙහි මහා සළ පිළිම ගෙය තුළ ජලය පිරවිමට කාන්තානක් සිටි බව ද දක්වයි. (Ranawella 1995.140) මීට අමතරව කාන්තාවන් තමන්ගේ කුලයෙන් පැවත එන පාරම්පරික කර්මාන්තයේ ද නියලෙන්නට ඇති බව උපකල්නය කළ හැකි ය. මෙලෙස කාන්තාවන් රාජ්‍ය තුළ සාමාන්‍ය කාර්යන් කිරිමට පමණක් වෙන්වී සිටි ඇති බව ද හදුනාගත හැකි ය. මෙකී මුලාශ්‍ර සමස්ථය අධ්‍යනයේ දී පෙනෙන වැදගත් කරුණක් නම් පුරුෂයා හා සමානව කාන්තාව රාජ්‍ය තුළ සේවා සැපයිමේ නොයෙදුන බව උපකල්පනය කළ හැකි ය.මෙයට හේතුව කාන්තාවන්ට පුරුෂයාට තරම් අධ්‍යාපනයක් නොලැබීම නිසා බව හා සාම්ප්‍රදායික පවුල් සංස්ථාව තුළ කාන්තාවගේ කාර්යයන් යන ආදිය බලපාන්නට ඇති බව උපකල්පනය කළ හැකි ය.

සමස්ථයක් ලෙස අනුරාධපුර යුගයේ කාන්තාව සතුව දේපළ හා සේවා සැපයිම පිළිබඳ ව සමස්ථය නිශ්චිත වශයෙන් ශිලාලේඛන මුලාශ්‍ර මඟින් දැක්විය නොහැකි වුවත්, එකල සමාජයේ කාන්තාවගේ දේපළහිමිකම හා සේවා සැපයිමේ දී ලබා දී ඇති දායකත්වය පිළිබඳ යම් අවබෝධයක් මෙමගින් ලබා ගත හැක.

## ආශ්‍රිත ග්‍රන්ථ

Paranavithana, S. (1970)***Inscription of Ceylon***,Vol.1. Department of Archaeology.

De Silva, Wicramasingha. (1912-1927)***epigraphya zeylanica.*** Martino, Don.(Edited). Oxford University press,London.

අමරවංශ හිමි, කොත්මලේ. (1969)***ලක්දිව සෙල්ලිපි.*** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.